# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2123/34 - 2019 මැයි මස 14 වැනි අඟහරුවාදා - 2019.05.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2019 ජාතික වෙසක් පුණ්‍ය මහෝත්සවයට සමගාමීව තෙල්වත්ත, පුරාණ තොටගමු රත්පත් රජමහා විහාරයට අයත් පූජනීය ප්‍රදේශය, පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2103/33 - 2018 දෙසැම්බර් මස 28 වැනි සිකුරාදා ප්‍රසිද්ධ කරන ලද අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා වන මා හට පැවරී ඇති පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධනය කිරීම විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය,"**තෙල්වත්ත, තොටගමු පුරාණ රත්පත් රජමහා විහාර පූජාභූමිය**"යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

ගාමිණී ජයවික්‍රම පෙරේරා,<br>
බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍ය.

2019 මැයි මස 14 වැනි දින,<br>
බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය,<br>
අංක 135, අනගාරික ධර්මපාල මාවත,<br>
කොළඹ 07.

## උපලේඛනය

### තෙල්වත්ත, පුරාණ තොටගමු රත්පත් රජමහා විහාර පූජාභූමිය සංයුක්ත වන ප්‍රදේශය

සර්වේ ජනරාල්ගේ 2019 අප්‍රේල් 09 වන දින සහ අංක TGA/HKK/2019/277 (සංශෝධිත) දරන අනුරේඛනයේ නිරූපිත දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තෙල්වත්ත ග්‍රාමයේ පිහිටි හෙක්ටයාර් 2.5907 ක් විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශයෘ-

කැබලි අංක B

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය), කඩඉම් සිතියම 810089 (තෙල්වත්ත) කලාපය 4හි කැබලි අංක 4 සහ 5 |
| *නැගෙනහිරට* | : | කඩඉම් සිතියම 810089 (තෙල්වත්ත) කලාපය 4හි කැබලි අංක 4,5,7,6, 67 සහ 72 |
| *දකුණට* | : | කඩඉම් සිතියම 810089 (තෙල්වත්ත) කලාපය 4හි කැබලි අංක 79, 80, 98 සහ කැබලි අංක C |
| *බටහිරට* | : | කැබලි අංක C සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) |

කැබලි අංක C

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ කැබලි අංක B |
| *නැගෙනහිරට* | : | මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ කැබලි අංක B |
| *දකුණට* | : | කඩඉම් සිතියම 810089 (තෙල්වත්ත) කලාපය 4හි කැබලි අංක 98, 99, 100, 94 සහ කැබලි අංක H |
| *බටහිරට* | : | කැබලි අංක H සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) |

කැබලි අංක H

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ කැබලි අංක C |
| *නැගෙනහිරට* | : | කැබලි අංක C |
| *දකුණට* | : | කඩඉම් සිතියම 810089 (තෙල්වත්ත) කලාපය 4හි කැබලි අංක 94 සහ මාර්ගය |
| *බටහිරට* | : | මාර්ගය |

05 - 795

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.